# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2299/60 - 2022 සැප්තැම්බර් මස 30 වැනි සිකුරාදා - 2022.09.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 277/40 (iv)

**(188 වන අධිකාරය වූ) පුරාවස්තු ආඥාපනත**

16 වන වගන්තිය යටතේ වන නියමය

(188 වන අධිකාර වූ) පුරාවස්තු ආඥාපනතේ 16 වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍ය විදුර වික්‍රමනායක වන මම, මේ නියමය මගින්, මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ස්මාරක ඉහත කී ආඥාපනතේ කාර්යය සඳහා "පැරණි ස්මාරක" වශයෙන් සළකනු ලැබිය යුතු බවට ප්‍රකාශයට පත් කරමි.

**විදුර වික්‍රමනායක,**
බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍ය.

2022 සැප්තැම්බර් මස 21 වැනි දින,
කොළඹ දී ය.

**උපලේඛනය**

***පැරණි ස්මාරක ලේඛනය***

**දකුණු පළාත**

1. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බඹරැන්ද - දකුණ ග්‍රාම නිලධාරී වසමේ පිහිටි රත්මලේ ග්‍රාමයට අයත් දෙමහල් අම්බලම.

2. දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 97 ඒ - වැලිවත්ත ග්‍රාම නිලධාරී වසමේ පිහිටි දංගෙදර ග්‍රාමයේ ඩික්සන් මාවතේ, වරිපනම් අංක 33 දරන ස්ථානයේ ඇති ආණ්ඩුකාර නිල නිවස.

1A - G 37669 — 08 (2022/09)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**සබරගමුව පළාත**

3. සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, මාවනැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගනේතැන්න ග්‍රාම නිලධාරි වසමේ පිහිටි හිඟුල ග්‍රාමයේ ඇති පුරාවිද්‍යාත්මක සාධක සහිත මග්ගල නමින් හඳුන්වන ගල්තලාව.

4. සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, කෑගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 51 ජී - මීපිටිය ග්‍රාම නිලධාරි වසමේ පිහිටි මීපිටිය ග්‍රාමයට අයත් පැරණි කච්චේරි ගොඩනැගිල්ල.

5. සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, කෑගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පිටිහුම ග්‍රාම නිලධාරි වසමේ පිහිටි පිටිහුම කොට්ඨාස අංක 08 ග්‍රාමයට අයත් කෑගල්ල බාලිකා විද්‍යාල භූමියේ ඇති බුද්දෙනිපොලහේන වලව්ව.

6. සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, බලංගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නෙළුයාය ග්‍රාම නිලධාරි වසමේ පිහිටි මැදබැද්ද ග්‍රාමයේ ඇති පැරණි දාගැබ, ගොඩනැගිලි නටඹුන් සහ ප්‍රාග් ඓතිහාසික සිතුවම් හා බ්‍රාහ්මී අක්ෂර කෙටූ ලෙන ඇතුළු වෙනත් පුරාවිද්‍යාත්මක සාධක සහිත වෙහෙරගල කඳුවැටිය.

**මධ්‍යම පළාත**

7. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, ගඟවටකෝරලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බහිරව කන්ද ග්‍රාම නිලධාරි වසමේ පිහිටි දොඩම්වල ග්‍රාමයට අයත් දොඩම්වල අම්බලම.

8. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නාගොල්ල ග්‍රාම නිලධාරි වසමේ පිහිටි පිහිටි නාගොල්ල අම්බලම සහ සෙල්ලිපිය.

9. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පුටුහපුව ග්‍රාම නිලධාරි වසමේ පිහිටි පුටුහපුව පැරණි අම්බලම.

10. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කරල්ලියද්ද ග්‍රාම නිලධාරි වසමේ පිහිටි කරල්ලියද්ද අම්බලම.

11. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, විල්අමුණ ග්‍රාම නිලධාරි වසමේ පිහිටි විල්අමුණ ග්‍රාමයට අයත් අරාවෙලේ ඇළ හරහා ඉදිකර ඇති විල් අමුණ.

12. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උඩිස්පත්තුව ග්‍රාම නිලධාරි වසමේ පිහිටි උඩිස්පත්තුව නගරයේ ඇති මාර්ග පුවරුව.

13. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සිරිදිගන ග්‍රාම නිලධාරි වසමේ පිහිටි සිරිදිගන අම්බලම.

14. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හීල්ඔය ග්‍රාම නිලධාරි වසමේ පිහිටි හීල්ඔය ග්‍රාමයට අයත් වේරගොඩතැන්නේ ගල්වැට.

15. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හක්මන ග්‍රාම නිලධාරි වසමේ පිහිටි අඟුරුවැල්ලවත්ත ග්‍රාමයට අයත් දහයියාගල කටාරම් කෙටූ ලෙන.

16. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මැටිදෙණිය ග්‍රාම නිලධාරි වසමේ පිහිටි හාතියල්වෙල ග්‍රාමයේ ඇති කත්පැල අම්බලම.

17. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, රඹුක්පොත ග්‍රාම නිලධාරි වසමේ පිහිටි රඹුක්පොත, ගලේනුවර ග්‍රාමයට අයත් මැද මහනුවර කන්දේ ඇති ගලේනුවර බලකොටුව සහ මාළිගයේ නටඹුන්.

18. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බෝමුරේ ග්‍රාම නිලධාරි වසමේ පිහිටි බෝමුරය පුරාවිද්‍යා ස්ථානය.

19. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සඳසිරිදුනුවිල ග්‍රාම නිලධාරී වසමේ පිහිටි වලගෙදරගම ග්‍රාමයේ ඇති දුනුවිල අම්බලම.

**උතුරුමැද පළාත**

20. උතුරුමැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, මහවිලච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 267 - දෙමටමල්ගම ග්‍රාම නිලධාරී වසමේ පිහිටි බෝගොඩ ග්‍රාමයට අයත් මෙගලිතික සුසාන ස්ථානය.

21. උතුරුමැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, මධ්‍යම නුවරගම් පළාත, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 319 - බණ්ඩාරබුලංකුලම සහ අංක 298 - පැතිස්පුර ග්‍රාම නිලධාරී වසම්වලට අයත් බණ්ඩාරබුලංකුලම ග්‍රාමයේ පිහිටි පැරණි ගල් පාලම (නැගෙනහිර ගල් පාලම)

22. උතුරුමැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, හොරොව්පොතාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 121 - නිකවැව ග්‍රාම නිලධාරී වසමේ පිහිටි පරගහඋල්පත ග්‍රාමයට අයත් කටාරම් සහ ශිලා ලේඛන කෙටූ ලෙන් සංකීර්ණය සහිත ගොවිගල කඳුවැටිය.

23. උතුරුමැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, මැදවච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 62 - පුල්එළිය ග්‍රාම නිලධාරී වසමේ පිහිටි පුල්එළිය ග්‍රාමයට අයත් පැරණි දාගැබ, ගොඩනැගිලි සාධක සහ පියගැටපෙළ සහිත ගල්තලාව ඇතුළු තම්මැන්නාවිල වෙහෙර නමින් හැඳින්වෙන නටඹුන් ස්ථානය.

24. උතුරුමැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 23 - ඉහළ උස්ගොල්ලෑව ග්‍රාම නිලධාරී වසමේ පිහිටි ඉහළ උස්ගොල්ලෑව හාතියගිරිය ආරණ්‍ය සේනාසන භූමියේ ඇති පැරණි දාගැබ, පර්වත ලිපි 02 සහ පැරණි පොකුණ.

25. උතුරුමැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, ඉපලෝගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 514 - කුංචිකුලම ග්‍රාම නිලධාරී වසමේ පිහිටි කුංචිකුලම ග්‍රාමයට අයත් නෙල්ලියකන්ද නමින් හඳුන්වන කඳුවැටියේ උතුරු බෑවුමේ ඇති ලෙන් ලිපිය සහ කටාරම් සහිත ලෙන.

26. උතුරුමැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, රාජාංගණය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 433 ග්‍රාම නිලධාරී වසමේ පිහිටි යාය - 02 ග්‍රාමයේ ඇති නාග සළකුණු සහිත නයිගල නමින් හැඳින්වෙන ගල්තලාව.

27. උතුරුමැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 184 - වන්නම්කුලම ග්‍රාම නිලධාරී වසමේ පිහිටි කවරක්කුලම ග්‍රාමයට අයත් සඳහම් කුටිය අසපු භූමියේ ඇති පර්වත ලිපිය, නටඹුන් වූ දාගැබ, පියගැටපෙළ සහිත ගල්කන්ද නමින් හඳුන්වන ගල්පර්වතය.

28. උතුරුමැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, ඉපලෝගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 493 - ධාතුසේනපුර ග්‍රාම නිලධාරී වසමේ පිහිටි දියවර ගම්මානයේ ඇති කටාරම් සහිත ලෙන්, පැරණි දාගැබ් සහ වෙනත් පැරණි ඉදිකිරීම් සළකුණු ස්ථාන සහිත කෝමාරිකාගල යාය නමින් හඳුන්වනු ලබන ගල්වැටිය.

29. උතුරුමැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 34 - තම්මැන්නාව ග්‍රාම නිලධාරී වසමේ පිහිටි තම්මැන්නාව, ශ්‍රී ගාමිණී රජමහා විහාර භූමියේ ඇති පැරණි දාගැබ, උපෝසථඝරය, පොකුණ සහ පැරණි ඉදිකිරීම් සළකුණු සහිත ගල්පර්වත.

30. උතුරුමැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, රඹෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කුඩාගම ග්‍රාම නිලධාරී වසමේ පිහිටි කුඩාගම ශ්‍රී නාග පුරාණ විහාර භූමියේ ඇති ටැම්පිට විහාර ගොඩනැගිල්ල.

31. උතුරුමැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, තිරප්පනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 548 - අල්ලිස්ථානය ග්‍රාම නිලධාරී වසමේ පිහිටි අල්ලිස්ථානය විහාර මහා දේවි රජමහා විහාර භූමියේ ඇති දාගැබ, ගොඩනැගිලි, නටඹුන්, පොකුණු සහ ප්‍රාකාර බැම් සහිත ගල්තලාව.

32. උතුරුමැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, නොච්චියාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 331 - ළිඳවැව ග්‍රාම නිලධාරී වසමේ පිහිටි වැලිවැව ඉස්මත්ත ප්‍රාදේශයේ ඇති පැරණි දාගැබ සහ ගොඩනැගිලි නටඹුන්.

33. උතුරුමැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, නොච්චියාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 351- සරක්කුගල ග්‍රාම නිලධාරි වසමේ පිහිටි සරක්කුගල පුරාණ රජමහා විහාර භූමියේ ඇති පැරණි දාගැබ සහිත ගල්තලාව.

34. උතුරුමැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, හොරොව්පොතාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 137 - තවලමහල්මිල්ලෑව ග්‍රාම නිලධාරි වසමේ පිහිටි වලස්ගුණෑව වෙහෙරගල නමින් හඳුන්වන බ්‍රාහ්මී අක්ෂර සහිත කටාරම් කෙටූ ලෙන් සහ පියගැටපෙළ සහිත කඳුවැටිය.

35. උතුරුමැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 287 - කුඩාමානිංගමුව ග්‍රාම නිලධාරි වසමේ පිහිටි අන්දරවැව ග්‍රාමයට අයත් බ්‍රාහ්මී අක්ෂර සහිත කටාරම් කෙටූ ලෙන් සහ පැරණි ගොඩනැගිලි නටඹුන් සහිත ගල්තලාව.

36. උතුරුමැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 27 - හල්මිල්ලවැටිය ග්‍රාම නිලධාරි වසමේ පිහිටි යකාවැව ග්‍රාමයට අයත් ලෙන් සංකීර්ණය, පර්වත ලිපි සහ ගොඩනැගිලි, නටඹුන් සහිත උස්ගල් කන්ද නමින් හඳුන්වන කඳුවැටිය.

37. උතුරුමැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, කහටගස්දිගිලිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 208 - මහහල්මිල්ලෑව ග්‍රාම නිලධාරි වසමේ පිහිටි මහහල්මිල්ලෑව, ගුරුගල්හින්න නමින් හඳුන්වන ස්ථානයේ ඇති මෙගලිතික සුසාන සහිත භූමිය.

38. උතුරුමැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, පලාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 676 - මොරත්තේගම ග්‍රාම නිලධාරි වසමේ පිහිටි ගල්කරුයාය ග්‍රාමයේ ඇති ශිලා කුළුණු සහිත ගොඩනැගිලි ස්ථානය සහ ඒ ආසන්න ගල්තලාවේ ඇති පුරාවිද්‍යාත්මක සාධක.

39. උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, රාජාංගනය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 456 - රාජාංගනය ග්‍රාම නිලධාරි වසමේ පිහිටි යාය 18 ග්‍රාමයට අයත් මාළිගාතැන්න නමින් හඳුන්වන ස්ථානයේ ඇති පැරණි ගොඩනැගිලි, නටඹුන් සහ වෙනත් පුරාවිද්‍යාත්මක සාධක.

40. උතුරුමැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, තිරප්පනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 530 - කුට්ටිකුලම ග්‍රාම නිලධාරි වසමේ පිහිටි කුට්ටිකුලම ගල් ළිඳ, මූකලාන නමින් හඳුන්වන ඉඩමේ ඇති කටාරම් සහ බ්‍රාහ්මී අක්ෂර සහිත ලෙන්.

41. උතුරුමැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, කැකිරාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 607 - කීරියගස්වැව ග්‍රාම නිලධාරි වසමේ පිහිටි කීරියගස්වැව (මෙගොඩවැව) ග්‍රාමයට අයත් වීබැන්දහින්න කඳුවැටිය ආශ්‍රිතව ඇති ලෙන් සංකීර්ණය සහ පැරණි ගොඩනැගිලි, නටඹුන් සහිත ස්ථාන.

42. උතුරුමැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, ඉපලෝගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 519 - ඉහළකාගම ග්‍රාම නිලධාරි වසමේ පිහිටි ශ්‍රී බුදුගේකන්ද රජමහා විහාර භූමියේ ඇති ශිලා ලේඛන සහ කටාරම් සහිත ලෙන.

43. උතුරුමැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, ඉපලෝගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 519 - ඉහළකාගම ග්‍රාම නිලධාරි වසමේ පිහිටි ඉහළකාගම කොටබුද්ධාගල කඳුවැටියේ පිහිටි ශිලා ලේඛන සහ කටාරම් සහිත ලෙන.

44. උතුරුමැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, රඹෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 96 - කුඩාගම ග්‍රාම නිලධාරි වසමේ පිහිටි කුඩාගම ග්‍රාමයට අයත් ඉකිරිගොල්ලෑව වැව ඉස්මත්තේ පිහිටි ශිලා කුළුණු සහිත ගොඩනැගිලි, නටඹුන් ස්ථානය සහ පැරණි ප්‍රාකාරය.

45. උතුරුමැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, වැලිකන්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ත්‍රිකෝණමඩුව ග්‍රාම නිලධාරි වසමේ පිහිටි සෝමාවතිය වනරක්ෂිත භූමියේ ඇති පැරණි ප්‍රතිමා ගෘහය, දාගැබ, ගොඩනැගිලි, නටඹුන් සහ අනෙකුත් පුරාවිද්‍යාත්මක සාධක.

46. උතුරුමැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, බකමූණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 14 - සෝමියෙල් ග්‍රාම නිලධාරි වසමේ පිහිටි කෝට්ටපිටිය ග්‍රාමයට අයත් පැරණි ගොඩනැගිලි ස්ථානය සහ පැරණි දාගැබ.

47. උතුරුමැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, බකමූණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 03 - කරඳගොල්ල ග්‍රාම නිලධාරි වසමේ පිහිටි අත්තනකඩවල ශ්‍රී ශෛලබිම්බාරාම විහාර භූමියේ ඇති ශිලා කුළුණු සහිත ගොඩනැගිලි නටඹුන් ස්ථානය.

**බස්නාහිර පළාත**

48. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, දොම්පේ - වැකේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 03 - දනව්කන්ද ග්‍රාම නිලධාරි වසමේ පිහිටි දනව්කන්ද ප්‍රාග් ඓතිහාසික ලෙන.

49. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 351 - උඩුගොඩමංකඩ ග්‍රාම නිලධාරි වසමේ පිහිටි උඩුගොඩ - රුග්ගහවිල ග්‍රාමයේ ඇති උඩුගොඩමංකඩ පැරණි ගොඩනැගිලි නටඹුන් ස්ථානය.

50. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උදම්මිට ග්‍රාම නිලධාරි වසමේ පිහිටි උදම්මිට අම්බලම.

51. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, යටවක ග්‍රාම නිලධාරි වසමේ පිහිටි යටවක අම්බලම.

52. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මැදගම ග්‍රාම නිලධාරි වසමේ පිහිටි මැදගම ග්‍රාමයට අයත් ගම්පහ නගර සභා ගොඩනැගිල්ල.

53. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 366A - යටවක ග්‍රාම නිලධාරි වසමේ පිහිටි යටවක ලිහිණියගොල්ලවත්ත නමින් හඳුන්වන ඉඩමේ ඇති කටාරම් සහිත ගල්ලෙන.

**වයඹ පළාත**

54. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පඬුවස්නුවර බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 1346 - පඬුවස්නුවර සහ අංක 1352 ඔතේගම ග්‍රාම නිලධාරි වසම්වල පිහිටි අඹගහවැල්ල, තෝරගල්ල, කොක්ගල, වැල්මිරිස් කැලේ, පඬාපිටිය සහ දෙටියමුල්ල යන ගම්වලට අයත් වන පරිදි පිහිටා ඇති පඬාවැවේ බැම්ම.

EOG 09 - 0359

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.